ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2013 නොවැම්බර් 18 සඳුදා
06 වෙළුම - 03 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## දේව වචනය දැනගැනීම ඇගයීමට ලක්කළ
# බයිබල් දැනුම මිනුම තරගයේ
# ත්‍යාග ප්‍රදනෝත්සවය

Photos By : ASHEN S. SENARATHNA SLC

Lama Pradeepaya

# ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com


# මාරාන්තික සුළි කුණාටුවෙන් විපතට පත් ජනයා සිහි කරමු.

**ආදරණීය දුවේ පුතේ...**

2004 දෙසැම්බර් මස 26 දින අප ශ්‍රී ලංකාව ඇතුළු රටවල් ගණනාවකට බල පෑ දරුණු සුනාමිය ගැන ඔබට මතක ඇති. ඔබ මේ වන විටත් ඒ ගැන අසා ඇති. එදා ඒ දරුණු සුනාමිය අප රටට බල පෑ අවස්ථාවේදී මුළු ලොවක් කම්පාවට පත්වුනා. හැම රටකම මාධ්‍යවල ප්‍රධාන පුවතේ අරමුණ වුනේ ශ්‍රී ලංකාව ඇතුළු සුනාමියට මුහුණ දුන් අනෙක් රටවල් වල කම්පනයත්, හානියත් ගැන ලොවට හඬගා කීමටයි. උදව් උපකාර වලට සියළු ජනයින්ව පොළඹවා ලීමටයි. ඒ සියළු විපත් තමන්ට, තම පවුලට වුනු හැඟීමකින් තමයි සියළු රටවල් ක්‍රියා කළේ. විශේෂයෙන්ම ක්‍රිස්තියානි ආභාෂය ඇති බටහිර රටවල් ඒ මොහොතේදී වඩාත් කම්පනයට පත්වෙලා උදව් කිරීමට ඉදිරියට ආවේ ක්‍රිස්තියානි ප්‍රතිපත්තියේ ඇතුලාන්ත හරය හා ඒ දැක්ම ඔවුනට ක්‍රියාත්මක වන්නට දිරි ගැන්වීමක් කළ නිසයි. ''ඔබට මෙන් ඔබේ අසල් වැසියාට ප්‍රේම කරන්න, දුකේහිදී ඔවුනට ඇප උපකාර කරන්න''. ආදර දුවේ පුතේ ක්‍රිස්තියානි ආකල්පය ජීවත් කරවන රටවල් මේ නිසාම ඕනෑම මොහොතක සිදුවන විශාල කරදරයකදී හා විපතකදී අන් අයට උපකාර කරන්න පෙරට එනවා. ආධාර කරනවා. හැඟීම්බර වෙනවා. ඒ නිසාමයි සුනාමි විපත්තියේදී අපේ රටට ඒ තරම් ආධාර ලැබුණේ. අපේ රටේ ජනතාවගේ ජීවිත සනහාලන්නට ඔවුන් මූලිකත්වය ගෙන ක්‍රියා කළේ.

ආදර දුවේ පුතේ, ඒ සුනාමි විපත්තිය වගේම මහා විශාල විපත්තියක් ආසියා කලාපයේ තවත් රටකට මේ දිනවල මුහුණ දෙන්න සිදුවෙලා. ඒ තමයි පිලිපීනය හරහා හමාගිය දරුණු හයියාන් සුළි කුණාටුව. මේ වන විට මේ සුළි කුණාටුව නිසා දස දහසකට වඩා පිරිසක් මිය ගිහිල්ලා කියලා වාර්තා වෙනවා. ගම්බිම්, දේපළ, නිවාස, යාන වාහන, සම්පූර්ණයෙන්ම විනාශ කර, බිමට සමතලා කළ මෙම සුළි කුණාටුව එරටට බල පෑ දරුණුතම ස්වාභාවික විපත ලෙස ඉතිහාස ගතවනව කියලයි ආරංචි මාර්ග පවසන්නේ.

ඒ පමණක් නොවෙයි, මේ හයියාන් මාරාන්තික කුණාටුව හේතුවෙන් ඇතැම් ප්‍රදේශවල කොටු වී ඇති පීඩාවට පත් ජනයාට දින ගණනාවක් තිස්සේ කිසිදු ආධාරයක් ලබා දීමට නොහැකි තත්ත්වයකුත් උදා වෙලා. බලන්න, කොතරම් බෙද වාචකයක්ද? මොන දුකක්ද? 220,000ක පමණ ජනතාවක් වෙසෙන පිලිපීනයේ ලෙයිටි ප්‍රාන්තයේ අගනුවර ටැක්ලොබාන් නගරය සුනාමියකට පසුව දක්නට ලැබෙන ආකාරයට දිස්වූ බව ජගත් සංවිධාන ආපදා කළමනාකරණ කණ්ඩායම සඳහන් කරනවා. හයියාන් සුළි කුණාටුව ලෙයිටි නගරයට යන අසබඩ දූපත්වලට සිකුරාදා කඩා වැදී ඇත්තේ පැයට කි.මී. 315 ක වේගයෙන්. මේ හේතුවෙන් මුහුදු රැළි මීටර් තුනක් පමණ ඉහළ නැග ඇති අතර ජල කඳ රට තුළටම ගමන් කරලා.

ආදර දුවේ, පුතේ, මධ්‍යම පිලිපීනයේ කි.මී. 600ක පමණ භූමි ප්‍රදේශයක් මෙහි බලපෑමට ලක්වූ බව වාර්තා වෙනවා. ඒ පමණක් නොවේ, මුලින්ම කුණාටුව කඩා වැදුණ ගියුආන් නගරයේ සහ සමා දූපතේ තත්ත්වය පිළිබඳව මෙතෙක් තවම කිසිදු වාර්තාවක් ලැබිලත් නැහැ. දැන් ඔබට වැටහෙනවා නේද මේ දරුණු සුළි කුණාටුව නිසා පිලිපීනයට ඇති වී තිබෙන විනාශය. ජන ජීවිතය අවුල් වෙලා දරුවන් හාමතින් මියැ දෙනවා. ලෙඩ දුක් වැඩිවෙලා. තනිකරම දුක්ඛිත තත්ත්වයක් තමයි ඇති වෙලා තියෙන්නේ. මේ නිසාම අද ප්‍රබල ජනමාධ්‍ය වන බී.බී.සී. අල් ජසීරා, සී.එන්.එන්. ප්‍රාන්ස් 24 වැනි රූපවාහිනී මාධ්‍යයන් පුන පුනා මේ ගැන සඳහන් කරමින් ලෝකයට මේ ගැන මතක් කරමින් කථා කරන්නෙ, බොහෝ රටවල මේ ගැන කම්පාවෙන් කතා කරනවා. සුනාමියෙන් ගොඩ එන්න අපට උදව් කළ රටවල් අතරින් පිලිපීනයත් එකරටක්, අපේ කලාපයේ රටක් මේ විදිහට වැනසී යන විට අපේ හදවත් දැවී ඇවිලී යන්නට ඕනා. නමුත් අවාසනාවකට තවම අපේ රට මේ ව්‍යසනය ගැන කම්පිත වී නැහැ. සුනාමියෙන් ගොඩ ආ රටක් හැටියට අපට එලෙස හැසිරෙන්න බැහැ.

ඒ නිසා ආදර දුවේ පුතේ, මේ ව්‍යසනයේදී අපි මීට වඩා පිලිපීනයේ ජනතාව ගැන සංවේදී වීම අත්‍යවශ්‍යයි. කිතුනු අපගේ හදවත් මේ සම්බන්ධයෙන් ඇත්තෙන්ම වැල පෙන්නට ඕනා. ''අසල්වැසියන්ගේ දුක තුළදී අපේ සංවේදී බව'' දහමින්ම අපට මතක් කර දී තිබෙනවා. ඉතින් අපගේ යාච්ඤා වලදී මේ සහෝදර ජනතාව සිහිපත් කර යාච්ඤා කරමු. ඔවුනට සැනසීම ලැබෙනසේ අපේ යාච්ඤා ඔප්පු කරමු. මිය ගිය ආත්මයන් වෙනුවෙන් යාච්ඤා කරමු. දිය හැකි උපකාරය ගැන කල්පනා කාරී වෙමු. මෙය සාමාන්‍ය සිදුවීමක් ලෙස සලකා අමතක කිරීම අපට තරම් නොවේ. සුනාමි අවස්ථාවේදී අනෙක් රටවල් අපේ රට ගැන එලෙස සිතුවානම් අපේ තත්ත්වය කෙලෙස වන්නට තිබුනාද? එමනිසා කිතුනු අපගේ අසල්වැසි දයාව පිළිබඳව අන් අයට කියා දෙන්න මෙය අවස්ථාවන් කර ගනිමු.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




## පුත්‍රයාණන් වහන්සේ

❖ ප්‍රः ජේසු ස්වාමිදරුවන් උකුත් වුනේ කවදා ද?
උः මහා සිකුරාදා ය.

❖ ප්‍රः මරණින් පසු උන්වහන්සේගේ ශ්‍රී ශරීරයට කුමක් සිදුවූයේ ද?
උ උන්වහන්සේගේ ශ්‍රී ශරීරය ගල් ලෙනක තැන්පත් කරනු ලැබුයේ ය.

❖ ප්‍රः ඉන්පසු තුන් වන දා ජේසු ස්වාමිදරුවෝ කුමක් කළ සේක් ද?
උः තමන් වහන්සේගේ ශරීරය නැවත ප්‍රාණවත් කොට මහත් තේජසින් නැගිට වදාළසේක.

❖ ප්‍රः ජේසු ස්වාමිදරුවන් මළවුන්ගෙන් නැගිට වදාළ මංගල්‍යය සිදුකරන්නේ කවදා ද?
උः පාස්කු ඉරුදිනෙහි ය.

❖ ප්‍රः මළවුන්ගෙන් නැගිට වදාළ පසු ජේසු ස්වාමිදරුවෝ මේ ලෝකයෙහි කොපමණ කල් වැඩසිටි සේක් ද?
උः සතලිස් දවසක් ය.

❖ ප්‍රः මේ සතලිස් දවසේ දී උන්වහන්සේ කුමක් කළ සේක් ද?
උः විටින් විට තමන් වහන්සේගේ ගෝලයින්ට දර්ශනය වී ආගමේ සත්‍යයන් හි ඔවුන් ස්ථිර කළ සේක.

❖ ප්‍රः සතළිස් වන දා උන්වහන්සේ කුමක් කළ සේක් ද?
උः ස්වර්ග රාජ්‍යයෙහි පියාණන් වහන්සේ වෙතට වැඩිය සේක.

❖ ප්‍රः ජේසු ස්වාමිදරුවන් ස්වර්ග රාජ්‍යයට වැඩම කළ මංගල්‍යය සිදු කරන්නේ කවදා ද?
උः පාස්කු මංගල්‍යයට පසු සතලිස් වනදාය.

❖ ප්‍රः ජේසුස්වාමි දරුවෝ ස්වර්ගරාජ්‍යයෙන් නැවත බැස වඩින සේක්ද?
උः ලෝකාන්තිම දින දී ජීවතුන් හා මළවුන් විනිශ්චය කිරීම පිණිස ස්වර්ග රාජ්‍යයෙන් බැස වඩින සේක.

❖ ප්‍රः ජේසු ස්වාමිදරුවෝ දැන් කොතැන්හි වැඩ සිටින සේක් ද?
උः උන්වහන්සේ දේව ස්වභාවයෙන් සැම තැනම ද, දේව ස්වභාවයෙන් හා මනුෂ්‍ය ස්වභාවයෙන් පරලෝකයෙහි හා දිව්‍ය සත්ප්‍රසාදයෙහි ද වැඩ සිටින සේක.

## භාවනා කරමු

**පසුගිය ලිපියෙන්**

10. එසේ කියමින් ගැඹුරු ඇතුලාන්ත නිහඬතාවයට ඇතුලත් වන්න. නිශ්චල බව හා සාමය අත්දකින්න.
11. අවධානය බිඳුනොත් නැවත හුස්ම කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් නිහඬතාවයට ඇතුලත් වන්න.
12. භාවනාව අවසානයේදී ජේසුට ස්තුති කර ගීතිකාවක් හෝ යාච්ඤාවක් කියන්න.
13. භාවනාව පිළිබඳව පුංචි ඇගයීමක් කරන්න.

### ජේසු සමිඳුන්ගේ නම කියමින් කරන භාවනාව

ආදර දුවේ පුතේ, ''ජේසුගේ නම'' හරිම බලගතුයි. උන්වහන්සේගේ නම මතුරමින් කරන භාවනාව යාච්ඤාවකි. එක් අවස්ථාවකදී ජේසු මෙලෙස පවසා ඇත. ''මගේ නාමයෙන් අයදින කවර දෙයක් වුවද මම ඔබට දෙමි'' (ජුවාම් 14/14) උන්වහන්සේගේ උත්ථානයෙන් පසු ජේසු තුමාගේ නම කියා පේදුරු තුමා කොරෙකු සුව කළේය. ''නාසරෙත්හි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න'' (ක්‍රියා 3/6)

1. නිහඬ පරිසරයක සුදුසු ස්ථානයක් තෝරා ගන්න.
2. ශරීරය කෙළින් තියාගෙන පහසු ඉරියව්වකට වාඩිවන්න ඇස් දෙක පියාගන්න
3. අවට පරිසරයෙන් ඇසෙන ශබ්දවලට සවන් දෙන්න.
4. හෙමින් හෙමින් ඔබගේ හුස්ම කෙරෙහි අවධානය යොමු කරන්න. කිහිප වතාවක් ගැඹුරින් ආශ්වාස හා ප්‍රාශ්වාස අවධානයෙන් යුතුව කරන්න.
5. නැවත සාමාන්‍ය හුස්ම කෙරෙහි යොමු වී හුස්මේ රිද්මයට ජේසුගේ නම කියන්න. නැතිනම් ගයන්න.

උදා :- ★ ජේසු ජේසු නමෝ නමෝ
★ ජය ජය ජේසු /// නමෝ නමෝ
★ සැපසුම් වේ - කිතු සමිඳේ
★ ජේසු සමිඳුනි , ජේසු සමිඳුනි

6. ජේසුගේ නම කියමින් හෝ ගයමින් ම ගැඹුරු නිහඬතාවයකට ඇතුලත් වී ඇතුලාන්ත නිශ්චල බව හා සාමය අත්දකින්න.
7. අවධානය බිඳුනොත් නැවතත් ජේසුගේ නම කියමින් නිහඬ වෙන්න.
8. පසුව ජේසුට ස්තුති කර යාච්ඤාවක් හෝ ගීතිකාවක් කියන්න
9. භාවනාව පිළිබඳව පුංචි ඇගයීමක් කරන්න.

ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවිදි සොයුරිය

ඉදිරියට ......

# කීකරු කම

අද මම ඔබත් සමග බෙදා හදා ගන්න යන්නේ කීකරුකමේ ඇති වැදගත්කම පිළිබඳව. මීගමුවට නුදුරු ධීවර ගම්මානයක වෙරළ ආසන්න ප්‍රදේශයේ කුඩා දරුවන් පිරිසක් සෙල්ලම් කරමින් සිටින අතරවාරයේ බීමතින් සිටි තරුණයින් දෙදෙනෙක් ත්‍රිරෝද රථයක නැගී මේ දරුවන් අසලට පැමිණ තිබෙනවා. මෙසේ පැමිණි අය ටිපිටිප් , බිස්කට් චොකලට් වැනි දේ පෙන්වා මොවුන් රවටා ත්‍රි රෝද රථයට නංවා ගැනීමට උත්සහ කර තිබෙනවා.



මේ අයගෙන් වයස අවුරුදු 10 -11 ක් අතර වයසේ පසුවූ ගැහැනු දරුවන් දෙදෙනෙක් මේ ත්‍රි රෝද රථයට නැග තිබෙනවා මොවුන් නොහොබිනා නුසුදුසු ක්‍රියාවකට සූදානම් වන බව දැනගත් අසල සිටි කාන්තාවක් වහා ගෙදර යා යුතු බව සඳහන් කළත් මේ කුඩා දරුවන් කෑමට තිබූ දැඩි ආශාව නිසාත්, වැඩිහිටි පිරිමින් දෙදෙනා මේ දරුවන් මුලාවට පත්කරගෙන තිබීම නිසාත් දරුවන් කාන්තාවගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර



## ඔවදනක්

තිබෙනවා.

පසුව මෙම ත්‍රි රෝද රථය දෙස මදක් විමසිලිමත් ලෙස බැලූ එක් දරුවෙක් සිදු වී ගෙන යන දෙය පිළිබඳව මදක් වික්ෂිප්තව බලා සිට ඇය වහා දිව ගොස් තම මව්පියන්ට දැනුම් දෙන්නට වුවාය. අනතුරුව වහා ක්‍රියාත්මක වූ දෙමාපියන් නොපමාව සංචාරක පොලිස් ස්ථානය වෙත වාර්තා කරන්නට විය. පොලිස් නිලධාරීන් මේ පිළිබදව ඉතාම ඉක්මනින් ක්‍රියාත්මක වූ නිසා සිදුවිය හැකි වූ මහා විනාශයක් වළක්වා ගැනීමට හැකියාව තිබුනි.

ආදර දුවේ පුතේ කියමනක් තිබෙනවා. ඇහැට පේන දෙවියෝ දෙමව්පියෝ කියලා. දෙමව්පියන්ගෙ වචන වලට අවවාද අනුශාසනා වලට පිටුපා කටයුතු කළ දරුවන් ඉතා අවාසනාවන්ත තත්ත්වයන්ට මුහුණ දුන් අවස්ථා පමණක් නොව ජීවිත අහිමි කරගත් අවස්ථාද අපි කොතෙකුත් අසා ඇත්තෙමු. එම නිසා දෙව් වදන සිතේ රඳවාගෙන දෙගුරුන්ගේ සිත නොරිදා යහපත් අවවාද අනුශාසනා තුළින් ජීවිත ගොඩනගා ගන්නට උත්සහ කරමු.

**ජී.ඒ. නිමාලි ප්‍රනාන්දු ගුරු මව**

## මළවුන්ගේ මාසය වෙනුවෙනි.

කතෝලික සභාව මළවුන් වෙනුවෙන් පුණ්‍ය කර්මයන් කිරීමට අපව පොළඹවන්නේ "සමෝසධර්ම ලාභය" නමැති ඉගැන්වීම නිසයි. අප ජීවත් වන ලොව , අපේ පව් වෙනුවෙන් වන්දි ගෙවන ශුද්ධකාග්නිස්ථානයත්, දෙවියන් වහන්සේ දැකීමට වරම් ලබන ස්වර්ගයත් අතර පවතින ත්‍රිවික සම්බන්ධතාවය "සමෝස ධර්ම ලාභය" ලෙසින් හැඳින්වෙයි. මෙලොව සිටින අයට ශුද්ධිකාග්නිස්ථානයේ සිටින ආත්ම සඳහා පිහිට විය හැකියි. ඒ සඳහා "මළවුන්ගේ මාසය" තුළ කිතුනුවන් විශේෂිත ක්‍රියාකාරකම් වල නිරත වෙයි.

දිව්‍ය පූජා ඔප්පු කිරීම එයින් ප්‍රධාන යි. දන ධර්ම , දිළිඳුන්ගේ දුකට පිහිට වීම, ආදියෙන් ද මළවුන් වෙනුවෙන් පුණ්‍යකර්ම කළ හැකියි. තමන්ගේ මියගිය ඥාති හිතෛෂීන් වෙනුවෙන් අධ්‍යාපනය සඳහා අඩුපාඩු ඇති සොහොයුරෙකුට/ සොහොයුරියකට හෝ කීප දෙනෙකුට පිහිට විය හැකි නම් දෙවිඳුන් ඉදිරියේ එය කොතරම් අගේද?

ඔබ ආර්ථික අසීරුතා අඩු පවුලක දරුවකු නම් ඉහත කරුණ සඳහා ඔබේ දෙමාපියන් පොළඹවන්නට ඔබට හැකිනේද? සැබවින්ම එය උතුම් පුණ්‍යකර්මය ක් වන්නේය. ළමා ඔබේ ඉල්ලීම ඉටුකරන්නට හැකියාව ඇති දෙමාපියන් එය ඉටු කරනු නොඅනුමානයි. මළවුන්ගේ මාසය "ජීවතුන් ජීවත් කිරීමේ මාසයක් බවට හරවා ගැනීමට අපි වෙර දරමු. ඔබ එතරම් ආර්ථික ශක්තියක් නොමැති පවුලක දරුවෙක් නම් මුදල්වියදම් නොවන පුණ්‍ය කටයුතු වල ඔබට නිරත විය හැකිය.

ඔබේ පංතියේ අධ්‍යාපන දුබලතා ඇති දරුවකු සමග දැනුම බෙදා ගන්න ඔබට හැකියි. උදහරණයක් හැටියට ඔබ ගණිත විෂයයට දක්ෂ දරුවකු නම් ගණිතයට දුර්වල දරුවකුට උදව් වීම ඔබට කළ හැකියි. එවැන්නක්ද "දනය" කි. මළාවූ ආත්ම වෙනුවෙන් ළමා ඔබට එය ඔප්පු කළ හැකියි.

**ඩික්සන් ඇන්ටනි මාමා**

"නොවැම්බර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, , ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

මාසික සිතිවිල්ල



සේයා :- අශේන් එස්. සේනාරත්න

# විශිෂ්ට දස්කම් පෑ ගම්පහ සිරිකුරුස විදුහලේ බැඩ්මින්ටන් ක්‍රීඩිකාවෝ




කුරුණෑගල ඩී.බී වෙලගෙදර විද්‍යාලීය බැඩ්මින්ටන් ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරන ලද විවෘත බැඩ්මින්ටන් තරගාවලිය කුරුණෑගල වෙලගෙදර ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පසුගියදා නිමාවට පත්විය. එහිදි ගම්පහ සිරි කුරුස විද්‍යාලීය බැඩ්මින්ටන් ක්‍රිඩිකාවෝ විශිෂ්ට දක්ෂතා දැක්වුහ. මෙහිදි 17 න් පහළ ඒකල ශූරතාව හා අනුශූරතාව, 17 න් පහළ යුගල ශූරතාව, 15 න් පහළ ඒකළ අනුශූරතාව, 13 න් පහළ යුගල අනුශූරතාව හා ඒකල තෙවන ස්ථානය දිනා ගැනීමට සමත් වුහ.

ජයග්‍රාහි ක්‍රිඩිකාවෝ සිරිකුරුස විදුහලේ විදුහල්පතිනි ගරු මේරී දීපානී පැවිදි සොයුරිය, පුහුණුකරු මහේෂ ඒකනායක හා කණ්ඩායම් භාර ආචාරිණී පුෂ්පා පෙරේරා සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට මුහුණ දුන් අයුරු. **(කුමර)**

# කුරුණෑගල පදවියේ මිල්ලව භාග්‍යවත් ජුසේවාස් දෙව්සත්හලට විසිපස් වසරක් සපිරේ



'දහම් කෙතයි පුදැදුරු දිවියයි ඔබ කළ විසිපස් වසරයි'' යන්න තේමාව යටතේ, කුරුණෑගල පදවියේ භාග්‍යවත් ජුසේවාස් කනිටු දෙව්සත්හලේ 25 වන ජයන්ති සැමරුම ශ්‍රී ලංකාවේ හිටපු අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි, විශ්‍රාමික රදගුරු අති උතුම් ඇන්ටනි රේමන්ඩ් පීරිස් හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

දෙව්සත්හල් අධ්‍යක්ෂ ගරු නිහාල් ඕබ්‍රිස් , පදවි දේව කැඳවීම් අධ්‍යක්ෂ ගරු හර්මන් සරත්චන්ද්‍ර පියතුමන්ගේ අනුශාසකත්වයෙන් දෙව්සත්හලේ සිසුහු එක්ව මෙය සංවිධානය කළහ. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**කසුන් මධුසංක, භාග්‍යවත් ජුසේ වාස් කනිටු දෙව්සත්හල, මිල්ලව**
**(සේයා :- ගරු හර්මන් සරත්චන්ද්‍ර පියතුමා)**



කලමුල්ල මීසමේ කටුකුරුන්ද ශු. පිලිප්නේරි දහම් පාසලේ ශිෂ්‍ය නායක සංගමය, ආචාර්ය මණ්ඩලය හා දෙමාපිය සංගමය එක්ව ඉදිරිපත්කළ ''මරියාංජලී'' (දෙව්මව් නැමදීම) ගී නළුව පසුගිය දා කළුතර සිරිකුරුස විදුහලේ ශ්‍රවණාගාරයේදී රඟ දැක්විය. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**රේනුකා සිල්වා**



මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ ප්‍රාථමික අංශයේ කලා උළෙල, ''හෙළ දැයේ අරුණලු'' රූපවාහිනි වැඩසටහන් අධ්‍යක්ෂ සරත් ආනන්ද මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. **රූත් ප්‍රනාන්දු**

# මොරටුව කටුකුරුන්ද ධර්මදූත ළමෝ ස්ථිර සමාජිකත්ව පදක්කම් ලබති

මොරටුව කටුකුරුන්ද ශා. මරියා දේවස්ථානයේ රෝස කුසුම් ධර්මදූත ළමා සමාජිය ළමුන්ට ස්ථිර පදක්කම් පැළඳීමේ දිව්‍ය යාගය කොළඹ කලාපයේ ත.ක්‍රි. ශිෂ්‍ය ව්‍යාපාරය, දේව කැඳවීම් හා ධර්මදූත ළමා අධ්‍යක්ෂ ගරු ප්‍රෙඩි ශාන්ති කුමාර් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් මීසම් සේවක ගරු ක්‍රිෂන්තස් ප්‍රනාන්දු (නි.ම.නි.) පියතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්වුණි. දේව මෙහෙය අවසානයේ පදක්කම් ලබාගත් දරුවන් සජිවිකයන් හා පියතුමන්ලා ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.



# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## තුන්වන තේමාව

**සාමාන්‍ය පෙළ විභාගයේ තුන්වන තේමාව වන්නේ, "දේව පනත් පිළිපදිමින් නීතිගරුක හා සදාචාර සම්පන්න ජීවිතයක්" ඒ හා අදාළව 2008 - 2012 පසුගිය ආශ්‍රිත ප්‍රශ්නවලට ආවරණය නොවූ ආදර්ශ අනුමාන ප්‍රශ්න කිහිපයක් අපි මෙම කලාපයෙන් විමසා බලමු.**

**1. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව දෙවන පනතට විරුද්ධව අප විසින් කරනු ලබන පාප කවරේද?**

★ දේව අපහාස කිරීම
★ දෙවියන් වහන්සේට විරුද්ධව කතා කිරීම
★ ක්‍රිස්තුන් වහන්සේට විරුද්ධව කතා කිරීම
★ මරියතුමියට විරුද්ධව කතා කිරීම
★ ශුද්ධවන්තයන්ට විරුද්ධව කතා කිරීම

**2. දෙවියන් වහන්සේගේ නාමය තම වාසිය තකා භාවිත කරන මිතුරෙකුට ඔබ දෙන අවවාදය කුමක්ද**

★ දෙවියන් වහන්සේගේ උතුම් නාමයෙන් නොදිව්රවන්න
★ දෙවියන් වහන්සේගේ නාමයට අගරු වන ලෙස ක්‍රියා නොකරන්න
★ දෙවියන් වහන්සේගේ නාමය ප්‍රශංසාවටත්, ආශිර්වාදයටත් පමණක් භාවිත කිරීමට යොමු වන ලෙසයි.

**3. තෙවන දේව පනතට විරුද්ධව අප සිදු කරන පාප තුනක් ලියන්න**

★ සිතා මතා ඉරුදින දිව්‍ය පූජාවට සහභාගී නොවීම
★ දිව්‍ය පූජාව තුළ අවබෝධයෙන් නොසිටීම
★ ඉරුදින සම්පූර්ණ දිව්‍ය පූජා යාගයට සහභාගී නොවීම

**4. සබත් දිනය පිළිබඳව කතෝලික සභා ධර්මෝපදේශයේ සඳහන් වන කරුණු 5 ක් ලියන්න.**

★ සබත් දින දිව්‍ය පූජාව තුළින් කුරුසියේ ජේසු සමිඳුන් කළ ජීවිත පරිත්‍යාගයට අප එක්වීම
★ දෙවියන් වහන්සේගේ ගිව්සුමට සහභාගි වීම
★ ඉරුදින දෙවියන් වහන්සේගේ දවසයි.
★ ජේසුස් වහන්සේ උත්ථාන වූ දවසයි
★ දෙවියන් වහන්සේගෙන් ලැබුණු යහපත් දෙයට ස්තුති කරන දවසයි.

**5. කිතුනු දරුවෙක් ලෙස ඉරුදින ශුද්ධ ලෙස ගත කිරීමට ඔබ ගන්නා පියවර තුනක් ලියන්න.**

★ ඉරුදින මුළු දිව්‍ය පූජාවට සහභාගි වීම
★ දේව වාක්‍ය කියවා එය මෙනෙහි කිරීම
★ රෝගී වූ අය බැහැදැකීමට යාම

**6. සිව්වන දේව පනතට අනුව යුතුකම් හා වගකීම් පැවරෙන පාර්ශවයන් හතර නම් කරන්න.**

★ දෙමාපියන් ★ දරුවන් ★ පාලකයන් ★ පුරවැසියන්

**7. පස්වන දේව පනතට අදාළව පාසල් පරිසරය තුළ ඔබට අනුගමනය කළ හැකි සාරධර්ම තුනක් ලියන්න.**

★ පස්වන දේව පනත, ජීවිත විනාශ නොකිරීමයි
★ පාසල් භූමිය තුළ වගා ව්‍යාපාරයක් ආරම්භ කිරීම
★ පාසල් වත්තට එන අහිංසක සතුන්ට හිංසා නොකිරීම
★ ජීවිතයට හානි කරන මත්ද්‍රව්‍ය වැනි දේ පාසල් පරිසරයට ගෙන එමෙන් වැළකීම

**8. "ඔබගේ ශරීරය ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වන බව ඔබ නොදන්නහුද?" මෙය සඳහන් වන නව ගිව්සුම් ග්‍රන්ථය කුමක්ද?**

★ 1 කොරින්ති

**9. ශුද්ධවූ වස්තුවක් වූ මනුෂ්‍ය ශරීරය පිළිබඳව කිතුනුවාගේ වගකීම කුමක්දැයි කරුණු පහකින් විස්තර කරන්න.**

★ හැසිරීම සංවරශීලි විය යුතුය
★ කතාබහ යහපත් විය යුතුය
★ කිතුනුවාගේ ඇඳුම් විනිත විය යුතුය
★ ස්වකීය ශරීරය පිළිබඳ ගෞරවණීය හැඟීමක් තිබිය යුතුය.
★ හැඟීම් වලට වහල් නොවී චරිත පාරිශුද්ධිය රැක ගැනීමේ ශක්තියක් තිබිය යුතුය.

**10 අටවන දේව පනතට විරුද්ධව සිදු කරන පාප තුනක් ලියන්න**

★ අටවන දේව පනත, බොරු නොකියන්න යන්නයි.
★ කේලම් කීම ★ කටකතා පැතිරවීම
★ නිල රහස් හෙළි කිරීම

**11. අද ජාත්‍යන්තර වශයෙන් පවත්නා සමාජ විරෝධි ක්‍රියා සඳහා නිදසුන් තුනක් ලියන්න.**

★ අල්ලස් හා දූෂණ ★ අනුන් නොමඟ යවන කතා
★ අසත්‍ය තොරතුරු ප්‍රකාශය

**12. පාවුළු තුමාගේ එපිස 6:14-17 ලිපියේ මතු කරන ප්‍රධාන අදහස් පහක් ලියන්න**

★ ගැලවීම නැමති හිස් වැස්ම පැළඳගන්න
★ දේව වචනය නැමති කඩුව ගන්න
★ ධර්මිෂ්ඨකම නැමති ළය වැස්ම පැළඳගන්න
★ සත්‍ය නැමති පටියෙන් ඉඟටිය බැඳගන්න
★ විශ්වාසය නැමති පළිහ ගන්න.

ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය (32)

## රෙපරමාදු ආභාෂයෙන් බිහි වෙන නව චින්තන රටා

යුරෝපීය ක්‍රිස්තියානිය තුළ 16 වන සියවසේදී ඇතිවු රෙපරමාදු විපර්යාසය ලූතර්, කැල්වින්, සුවිංග්ලි වැනි රෙපරමාදු නායකයින්ගේ ජීවිත කාලවලට සීමා වූවක් නොවේ. එහි ප්‍රතිඵල කිසිසේත් කෙටිකාලීන නොවීය. රෙපරමාදු යන පොදු නමින් හැඳින්වෙන සභා දිගටම බිහිවන්නට විය. එහෙත් 17 වෙනි 18 වෙනි ශත වර්ෂවලදී නව සභාවලට අමතරව තවත් දෙයක් බිහිවන්නට විය. ඒ සම්ප්‍රදායානුකූල ක්‍රිස්තියානි සභා තුළ බිහිවන්නට පටන් ගත් නව චින්තන රටා ය. එම චින්තන රටා ක්‍රිස්තියානියේ සම්ප්‍රදායානුකූල ස්වරූපය සෑහෙන දුරකට වෙනස් කිරීමට සමත් විය. ක්‍රිස්තියානි චර්යා රටාව ගැන බොහෝ දෙනෙකු තුළ වු අවබෝධය අලුත් අතකට හැරවීමට තරම් ඒවා ප්‍රබල විය.

17 වෙනි 18 වෙනි ශත වර්ෂවලදී එසේ ඇතිවූ චින්තන රටා අතරින් තුනක් ප්‍රධාන යැයි කිව හැක. එකක් ප්‍රංශයට විශේෂවූ ජැන්සෙනිස්ත වාදයය. දෙවැන්න, එංගලන්තයට ආවේනිකවූ පියුරිටානු වාදයය. ඒ දෙක ක්‍රිස්තියානියේ ආගමික භාවය රැක ගැනීමට ඇතමුත් විසින් දරණ ලද ප්‍රයත්නයක ප්‍රතිඵල සේ ගත හැක. එහෙත් තුන්වැන්න ඒ අතින් වෙනස් ය. බොහෝ ක්‍රිස්තු භක්තිකයින් විසින් දකිනු ලබන පරිදි, එය ක්‍රිස්තියානියේ ආගමික භාවය රැක ගැනීමට වඩා නැසීමට දරණ ලද ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. එංගලන්තය හා ප්‍රංශය යන රටවල් දෙක තුළ එක විටම ඇතිවූ එය විද්‍යාත්මක දේව වාදය හෝ වඩා කෙටියෙන්, ''විද්‍යා ආගම'' සේ හැඳින්විය හැක. ඒ තුන අපේ විශේෂ සැලකිල්ලට ලක්විය යුතුව ඇත.

### ප්‍රංශයේ ජැන්සනිස්ත වාදය

රෙපරමාදු විප්ලවයෙන් ඇරඹුන යුගයේදී ප්‍රංශය යුරෝපය තුළ එක්තරා මූලිකත්වයක් දැරූ රටක් විය. රෙපරමාදු විප්ලවයට හවුල් වී, රෝමයෙන් බිඳී යෑමට ඕනෑකමක් නොදැක්වූ විශාලතම රාජ්‍යයද ප්‍රංශය විය. ප්‍රංශය දිගටම රෝමානු කතෝලික රටක් විය. එහෙත් රෙපරමාදු විප්ලවය එයටද බලනොපෑවායැයි කිව නොහැක. රෙපරමාදු සභා ප්‍රංශය තුළද බිහි විය. 1560 දී කැල්වින්වාදී රෙපරමාදු නිකායක් එහි ඇරඹුණේය. එහි සාමාජිකයෝ ''හියුගනොට්වරු'' සේ හැඳින්වේ. කතෝලික සභාව සමගද රජය සමඟද මොව්හු නිතර සටන් කළහ.

මෙහි අපි සාකච්ඡා කළ යුතුවන ජැන්සෙනිස්තවාදය එය සේම රෙපරමාදු විප්ලවයේම අංකුරයකි. එහෙත් එය ස්වාධින ආයතනයක් හෝ සභාවක් වශයෙන් ගත යුත්තකට වඩා කතෝලික සභාව තුළම වූ නව චින්තන රටාවක් වශයෙන් පමණක් ගත යුත්තකි. ජැන්සෙනිස්ත වාදය කුමක්ද කියා නිරවුල්ව තේරුම් ගැනීමටත්, හරියාකාර අගය කිරීමටත් එය බිහිවූයේ කුමනාකාර ආගමික හා දේශපාලන පසුබිමකින් යුත් ප්‍රංශයක් තුළද කියා අප සොයා බැලිය යුතුව ඇත.



### සාන්ත විසෙන්ති දි පෝල් (1580- 1660)

රෙපරමාදු විප්ලවය නිසා යුරෝපීය රටවල බොහෝ දෙනෙක් තමන් ක්‍රිස්තියානිය ඇදහිය යුත්තේ කෙලෙසද කියා අසමින් එයට අලුත් පිළිතුරු දෙමින් සිටි අතරතුරේ අර්ථවත්වූද වැඩදායකවූද විලාශයකට ක්‍රිස්තියානිය හැඩගස්වන ව්‍යාපාරයක් ප්‍රංශයේ ආරම්භ වී තිබුණේය. එයට මුල පුරන ලද්දේ ප්‍රංශයේ පමණක් නොව මුළු ක්‍රිස්තියානි සමාජයේමද ආදර්ශයට හා ගෞරවයට ලක්වී ඇති වින්සෙන්ති ද පෝල් තුමාය. සිංහලයින් අතර ඔහු වඩා බහුලව ''වින්සින්ති පෝල් '' යන තරමක් කෙටි නමින්ද හැඳින්වේ. අද බොහෝ දෙනෙකුට එම නම දැනෙන්නේ ''අසරණයින්ට කරුණාව''යන අර්ථයෙන් යුක්ත වූවක් සේ ය.

විසෙන්ති පෝල් තුමා ප්‍රංශයේ ඉතාමත් පිටිසර ගම්මානයක දේවස්ථානයක් භාරව සිටි කතෝලික පූජකයෙකු විය. ඔහු කුඩා පවුලකින් බිහි වුවකු හෝ කඩවසම් පුද්ගලයකු හෝ නොවුවද ලොකු දේවල් කිරීමට හැකියාවක් ප්‍රදානය කරන සහජ දක්ෂතාවලින් යුක්ත වුවෙකු විය. ලොකු දේවල් කිරීමට ඔහු තුළ ආශාවක්ද විය. රාජ මාලිගයේ පූජා කටයුතු මෙහෙයවන ප්‍රධාන පූජකයා ලෙසද ඔහු තෝරා පත්කර ගනු ලැබුණේ ඔහු තුළවූ ඒ සහජ දක්ෂතා නිසාම විය යුතු ය. එම තනතුර ඔහු අගය කළ නමුදු ඔහු එහි වැඩිකල් නිරත වූයේ නැත. අවට ලෝකය අසරණකමටද ,අවිද්‍යාවටද, දුරාචාරයටද මැදිවී පීඩා විඳිමින් සිටියදී ඔහු රාජ මාලිගාවක් තුළ සැප සම්පත් විඳිමින් සිටීම නුසුදුසුයැයි ඔහුට හැඟෙන්නට විය දුගී දුප්පතුන්ට සේවය කිරීමට දෙවිදුන් ඔහු අමතන බවත් ඔහුට දැනෙන්නට විය. ඒ ඇමතීමට ඔහු අවනත විය.

ඉදිරියට .......

**සංස්කාරක පියතුමන් විසිනි**

කිතුනු උරුමය

# ලෝකයේ ඉප

## පානගියා එකටුන්ටාපිලියානි (දොරටු සියයේ) දෙව්මැඳුර



ග්‍රීසියේ පැරිකියා නුවර පිහිටි ග්‍රීක ඕතඩොක්ස් සභාවට අයත් ඉතාමත් ඉපැරණි දෙව්මැඳුරකි. මෙහි ඉතිහාසය ක්‍රි.ව. 326 දක්වා ඈතට දිවයයි. එහි ඉපැරණි ලක්‍ෂණ මගින් ක්‍රි.ව. 319 දී රෝම අධිරාජ්‍යයේ කිතුදහම රාජ්‍ය ආගම බවට පත්වීම සනිටුහන් කරයි. පානගියා එකටුන්ටා පිලියානි යන්නෙන් දොරටු සියයක් යන්න අරුත් ගැන්වේ. මේ දෙව්මැඳුර ඓතිහාසික බයිසෙන්තියාන යුගයේ දෙව්මැඳුරු සංකීර්ණ වලට කදිම දෘෂ්‍ය සාක්ෂියකි.

ස



බල්ගේරියාවේ
අයත්වේ. රෝමන්
අමතර කොටස් එ



## ජුබෙයිල් දෙව්මැඳුර

සෞදි අරාබියේ අල් ජුබෙයිල් හි දී සතරවන සියවසේදී ඉදිවූ නෙස්ටෝරියාන දෙව්මැඳුරකි. ඓතිහාසික වැදගත්කමකින් යුතු මේ ස්ථානය සෞදි රජය මගින් එරට ජනතාවටත් , විදේශික සංචාරකයන්ටත් සඟවා තබා ඇති අතර පුරා විද්‍යාඥයන්ටවත් මේ බිමට ඇතුළු වීමට අවසර ලබා දෙනු නොලැබේ.



# ැරණිම දෙව්මැඳුරු

## ාන්ත ජෝර්ජ් තුමාගේ දෙව්මැඳුර



සෝෆියා හි ඉදිව ඇති මේ දෙව්මැඳුර පෙරදිග ඕතඩොක්ස් සභාවට වරුන් විසින් මේ දෙව්මැඳුර ඉදිකරන ලද අතර පසු කාලයේදී ඊට ක්කරන ලදී.

**ශිරාන් මෛත්‍රී විසිනි**



## ට්‍රාස්ට්වෙරී හි සාන්ත මරියා දෙව්මැඳුර



ඉතාලියේ රෝම නුවර පිහිටි මේ දෙව්මැඳුරේ බිත්ති හා පොළොව ක්‍රි.ව. 340 තරම් ඈත ඉතිහාසයකට උරුම හිමිකම් කියයි. මේ මුල්ම සිද්ධස්ථානය ක්‍රි.ව. 221 දී සහ ක්‍රි.ව. 227 දී අති උතුම් පළමුවන කැලිස්ටස් ශුද්ධෝත්තම පියතුමා ඉදිකිරීම් ඇරඹූ අතර අති උතුම් පළමුවන ජුලියස් සසුන් පියා කටයුතු අවසන් කළේය. වර්තමාන දෙව්මැඳුරේ බිත්ති පොළව ක්‍රි.ව. 340 දී සිදුකර ඇතැයි සොයාගෙන ඇත.

## සාන්ත පේදුරු හා පාවුළු මුනිඳුන්ගේ දෙව්මැඳුර

සර්බියාවේ නොවි පසාර් දෙව්මැඳුර ස්ටාරිරාස් හි පිහිටා ඇත. හතරවන සියවසේ දී මුලින්ම ඉදිවූ මේ දෙව්මැඳුරට හත්වන හා නමවන ශත වර්ෂවලදී යම් යම් කොටස් අලුතෙන් එකතු කර ඇත. පෙරදිග ඕතඩොක්ස් සභාවට අයත් මේ දෙව්මැඳුර රාස් කඳුවැටියේ පිහිටා ඇත. සර්බියාවේ ඉපැරණිතම දෙව්මැඳුර මෙයවන අතර යුනෙස්කෝව මගින් ලෝක උරුමයක් ලෙසටද නම් කර ඇත.



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 117

**'So that'** යන වචන දෙක යුගලයක් වශයෙන් ඉංග්‍රීසියේදී භාවිතා කළාම ඒකෙ තේරුම "වනු පිණිස" වගේ අදහසක්. යම් පුද්ගලයෙක් "ඇති වනු පිණිස," "ඇති කිරීමේ අභිලාෂයෙන්" යමක් කරනවා කියන අදහස ප්‍රකාශ කිරීමට **so that** යොදනවා.

අපි වැකි වලින්ම ඉගෙන ගනිමු.

1. She is learning English, ***so that*** she can go to London.
(ෂී ඉස් ලර්නිං ඉන්ග්ලිෂ්, සෝ දැට් ෂී කැන් ගෝ ටු ලන්ඩන්)
ඇයට ලන්ඩන් යෑමට හැකිවන පිණිස, (හැකිවන හෙයින්) ඇය ඉංග්‍රීසි ඉගෙන ගනී.
ඇය ඉංග්‍රීසි ඉගෙන ගන්නවා. එතකොට ඇයට ලන්ඩන් යන්න පුළුවන්.
අන්න එවැනි අදහසක් තමා කියැවෙන්නේ 'so that' යෙදුවම

තව නිදසුන් කීපයක් බලමු.

2. I bought a bicycle **so that** I can go to school on time.
(අයි බෝට් අ බයිසිකල් සෝ දැට් ගෝ ටු ස්කූල් ඔන් ටයිම්)
මම බයිසිකලයක් ගත්තා. එතකොට මට වෙලාවට පාසල් යන්න පුළුවන්.
"වේලාවට පාසල් යා හැකි වනු පිණිස, මම බයිසිකලයක් මිලදී ගතිමි." කියන අදහස මින් කියැවෙනවා.

3. Leave early **so that** you can catch the train.
(ලීව් අර්ලි සෝ දැට් යූ කැන් කැච් ද ට්‍රේන්)
කලින් යන්න. එතකොට ඔබට දුම්රිය අල්ල ගන්න හැකිවේවි.
(දුම්රිය අල්ලාගත හැකි වනු පිණිස ඉක්මනින් යන්න)

4. We bought a house in Colombo **so that** we could go to work early.
(වී බෝට් අ හවුස් ඉන් කලම්බු සෝ දැට් වී කුඩ් ගෝ ටු වර්ක් අර්ලි)
අපි කොළඹ ගෙයක් ගත්තා. එතකොට වැඩට යන්න ලේසියි.

5. I will give you a lift in my car **so that** you can go home earlier. (අයි විල් ගිව් යූ අ ලිෆ්ට් ඉන් මයි කාර්. සෝ දැට් යූ කැන් ගෝ හෝම් අර්ලියර්)
ඉක්මනට ගෙදර යාම සඳහා මම ලිෆ්ට් එකක් දෙන්නම්.

6. I will admit the fault **so that** the principal would not punish me.
(අයි විල් ඇඩ්මිට් ද ෆෝල්ට්. සෝ දැට් ද ප්‍රින්සිපල් වුඩ් නොට් පනිෂ් මී)
මම වරද පිළිගන්නවනම් එතකොට ගුරුතුමා මට දඬුවම් දෙන්නෙ නෑ.
ගුරුතුමා මට දඬුවම් නොදෙන පිණිස මම වරද පිළිගනිමි - යන අදහස

7. I hurred **so that** I wouldn't miss the bus.
(අයි හරීඩ් සෝ දැට් අයි වුඩින්ට් මිස් ද බස්.)
බස් එක නොවරදින පිණිස මම ඉක්මනින් ගියා.

8. Take an umbrella **so that** you won't get wet.
(ටේක් ඈන් අම්බ්‍රෙල්ලා සෝ දැට් යූ වෝන්ට් ගෙට් වෙට්.)
ඔබ වැස්සට නොතෙමෙනු පිණිස කුඩයක් ගෙන යන්න.

9. I gave her my address **so that** she could come to my place. (අයි ගේව් හර් මයි ඇඩ්‍රස් සෝ දැට් ෂී කුඩ් කම් ටු මයි ප්ලේස්)
අපේ ගෙදරට "එනු පිණිස" මම ඇයට ලිපිනය දුන්නා.

10. Use the microphone please! **so that** everybody could hear you properly.
(යූස් ද මයික්‍රොෆෝන් ප්ලීස් සෝ දැට් එව්රි බොඩි කුඩ් හියර් යූ ප්‍රොපර්ලි)

කරුණාකරලා මයික්‍රෆෝනය පාවිච්චි කරන්න.
හැමෝටම ඇසෙන පරිදී. හැමෝටම ඇසෙන පිණිස.

අපි **to , for** සහ **so that** කියන කරුණු ඇසුරෙන් අභ්‍යාසයක් කරල දැනුම තහවුරු කරගනිමු.

# කොටස් වශයෙන් පළවන කිතුනු යොවුන් නව කථාව.

**පසුගිය සතියෙන්.....**

## පූංචි සූවාමි

''කොහොම ද ආගමයි ජීවිතයයි එකට එකතු කරන්න මිනිසුන්ට කියා දෙන්නෙ?''

ඒ අපේ වගකීම. පූජකවරය දා ගීතිකා කණ්ඩායම ගැයූ ගීයක් පුංචි ස්වාමිගේ කන් ඇතුලෙ දෝංකාර දුන්නා.
..... වැඳුමට පිදුමට වහල් නොවන්නට සැමහට පහදා දී දෙවි ජනතාවට ඔබට ගෙනෙන්නට අවියක් වන්නට මා .....

''ෆදර් මාර වැඩක් වෙලා තියෙන්නේ''

අල්ලපු ගෙදර චන්දන බස් එකෙන් බැහැලා එනවා. කොළුවා විද්‍යාවට ටියුෂන් යනවා. ඉගෙනගන්නවා වගේම පල්ලියේ මීසමේ කටයුතු වලටත් උනන්දුයි. පූජා උදව් සමිතියෙත් ඉන්නවා.

''මිනිස්සුන්ට වෙඩි තියලා ෆදර්''
'' කෝ? කොහෙද?''
''ඇයි''
''මිනිස්සු ප්‍රොටෙස්ට් එකක් කරලා''
'මොනවටද''?
''බොන වතුර වලට ෆැක්ටරියකින් අපද්‍රව්‍ය එකතු වනවා ඒ වතුර බොන්න බැරි නිසා''
''අයිසේ ප්‍රොටෙස්ට් එකකට වෙඩි තියන්න බෑ. මානව හිමිකම් කඩවෙනවා.''
''ටියුෂන් පන්තියේ අපේ යාළුවෙකුගේ නෑදැයෙකුටත් වෙඩි වැදිලා දෙන්නෙක් ඉස්පිරිතාලෙ මගෙ යාළුවා තමයි කිව්වේ''

පුංචි සුවාමිගේ මොබයිල් එක වැදෙන්න පටන් ගත්ත එහා පැත්තේ කතා කරන්නේ පුංචි සුවාමි කෙනෙක්. එක පන්තියේ එකට ඉගෙනගත්ත. චන්දන කියූ කතාවම එයත් කියනවා. බොරුවක් වෙන්න බෑ. ඒ සුවාමි ගෙ ගම එහෙ චන්දන කිවූ විස්තරයට වැඩිය දෙයක් මොබයිල් එකෙන් ඇහෙනවා. අනිත් හැම දේටම වඩා මොබයිල් එක ඕෆ් කරන්. කලින් යාළුවා කිවුන වචන දෙක තුන පුංචි ස්වාමිගේ කන් පසාරුකරගෙන ගියා.

..... අපට දිවැසි මෙහෙවරක් ඉෂ්ට කරන්න ප්‍රාණ පරිත්‍යාගී වෙන්න කාලෙ ඇවිත් ......

පුංචි ස්වාමි හිතන්න පටන් ගත්තා සමාජ විද්‍යාව ඉගෙන ගනිද්දි අපට ප්‍රෝපෙසර් කිවුවා සංවර්ධනයේ ප්‍රතිලාභ පහල තට්ටුවට ළඟා වෙන්න ඕනා කියලා. එයා ඒක නම් කළේ **Trickle down Theory** කියලා. ඒත් සැබෑ සමාජ යථාර්ථය ඒකද? කොතනද පහළම තට්ටුව කියන අඩු ආදායම් ලාභීන්ට සහන සැලසිලා තියෙන්නෙ අඩු තරමින් බොන වතුර ටිකටවත් සැලකිල්ලක් නැත්නම් විරෝධතාවයක් පෙන්වන්න මිනිසුන්ට අයිතියක් තියෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය රැඳිලා තියෙන්නේ එතන. විරෝධතාවය සංවාදශීලිබවකට කරන ආරාධනයක් ඒත් එය මර්දනය කරන්න යොදන ක්‍රියා මාර්ගය ප්‍රචණ්ඩත්වය ඇති කරනව නම් ඒ ගැන ගැඹුරින් හිතන්න සිදුවෙනවා.



ඒත් මෙතන තියෙන මූලික ගැටලුව පරිසරය ගැන සළකන්නේ නැතුව මිනිස් ජීවිතයට ගරුත්වයක් නැතුව ආර්ථිකලාභය ගැන විතරක් කල්පනා කිරීම නේද?

''සල්ලි වලට අද කරන්න බැරි දෙයක් නෑ ෆාදර්?''
චන්දන කියන්නේ මහා කල කිරීමෙන් .
''හැම වෙලේම ප්‍රමුඛතාවය ලැබෙන්නේ සල්ලිවලට''
''ඒ මතය වෙනස් කරන්න අපි උත්සාහ කරන්න ඕනා පුතේ''
දේවරාජ්‍යයේ වටිනාකම්වල රුඳෙද්දි ධනය කියන්නේ යක්ෂයා කියලා අපිට තේරෙයි.

පූජා උදව් සමිතියේ රුස්වීම තියන්න පුංචි ස්වාමි චන්දනත් එක්ක නැගිට්ටෙ වැරදි වටිනාකම්වලට එරෙහිව අපි ජීවිතෙන් සාක්ෂි දරන්න ඕන කියන දැඩි අධිෂ්ඨානයෙන්.

කෝකි මාමා තලවිල යන්න ලැස්තිවෙලා සේරම වගකීම් ටික උදෙන්ම ඉවර කරන පාටයි. උන්දැට් ඉතින් එක වැඩක්යැ තියෙන් නේ. පල්ලිය පහුකරගෙන යන ආගන්තුක ස්වාමිලා, ලොකු ස්වාමිගෙයි , පුංචි සුවාමිගෙන් යාළු මිත්‍රයෝ සුවාමිලා, රුස්වීම්වලට එන අය මේ ඔක්කෝටම කෝකි මාමගේ පිහිට තමා. ලොකු සුවාමිට ගරුසරු ඇතිව එකත්පස්ව ඉන්න කෝකි මාමා පුංචි ස්වාමිට අවවාද අනුශාසනා දෙන්නේ තාත්තා වාගේ පුංචි සුවාමිගේ යාළුවෝ විහිළුවට කෝකි මාමට කියන්නේ ''ස්පිරිචුවල් ඩිරෙක්ටර්'' කියලා ඒ කියන්නේ ඇත්තටම උන්දෑ හොඳ වැඩිහිටි යෙක් නිසා.

පූජාත්වරයත් හැමෝටම ලැබෙන්නේ නෑ. කලාතුරකින් කෙනෙකුට ලැබෙන උතුම් වරප්‍රසාදයක් පියාණනි මම යාච්ඤා කරනවා හුගාක් ඔබවහන්සේ වෙනුවට මේ ගමන ඉස්සරහටම යන්න.....

**ඉදිරියට .......**

**ගරු ලිලියන් මැටිල්ඩා තන්ත්‍රිආරච්චි**
**ශු.ප.නි. පැවිදි සොයුරිය**



**ජේසුගේ කුඩාමල**

**ෂයිනි කව්ෂ්කා**

04 ශ්‍රේණිය

සිරිකුරුස විදුහල - ගම්පහ

**දේව අම්මා**

**නිපුනිකා සඳුනි**

08 ශ්‍රේණිය

සාන්ත ජෝශප් විදුහල - මීගමුව ශාඛාව





**ශු. ජුඩ් මුනිතුමා**

**මන්දාකිණි ප්‍රනාන්දු**

05 ශ්‍රේණිය

සා. ජුඩ් දහම් පාසල

ඉදිගොල්ල




**ශ්‍රී ශරීරය හා රුධිරය**

**ශෙනායා ප්‍රනාන්දු**

04 ශ්‍රේණිය

ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය

බම්බලපිටිය

**මෝස්තරයක්**

**රවින්දි හේෂානි වරුකා**

07 ශ්‍රේණිය

ශු. මිඛායෙල් දහම් පාසල

කළුතර, නාගොඩ





**භාග්‍යවත් ජුසේ වාස් පියතුමා**

**මලින්ද නවෝද්**

10 ශ්‍රේණිය

සදාසරණ දේව මාතා දහම් පාසල

බලගල

## සුදුවර චරිත

# නිස්සා හී ග්‍රෙගරි

ක්‍රි.ව. 330 දී පමණ කපදෝසියාවේ කිතුනු පවුලක උපන් අයෙකි. පාරම්පරිකව කිතු දහම ඇදහූ ධනවත් පවුලක උපන් අයෙකි. බැසිල් සහා පියාගේ සොහොයුරාවූ ඔහු දේශනාවාදියෙකි. ඔහුගේ දේශන බොහෝවිට ඒරියන්වාදීන්ට විරුද්ධ ඒවාය. නසියන්සස් හී ග්‍රෙගරි මෙන්ම ඔහුගේ දේශන හා ලියවිලි ද කාව්‍යමය ස්වරූපයක් ගනී. මෙලෙස බැසිල් තුමාව හඳුනා ගැනීමට හැකිවිය. කපදෝසියානු පියවරු යන යෙදුම භාවිත කර ඇත්තේ කපදෝසියාවේ සභාවේ පියවරු තිදෙනෙක් සම්බන්ධයෙන්ය.



කයිසාරියාවේ රදගුරුවරයකු නැගෙනහිර ප්‍රදේශයේ තාපසාරාම සංවිධානය කළ මහා බැසිල් (ක්‍රි.ව. 330-379), නිස්සා හී රදගුරුවරයා වූ බැසිල් තුමාගේ සොහොයුරු ග්‍රෙගරි (ක්‍රි.ව. 335-395), සහ කොන්ස්තන්තිනෝපලයේ පැවැත්වූ ප්‍රථම මන්ත්‍රණ සභා කාලයේ එම නුවර රදගුරුවරයා වූ නසියන්සස් හී ග්‍රෙගරි (ක්‍රි.ව. 329-389) මෙම පිවරුන් තිදෙනා වූහ. මොවුන් මහා කපදෝසියානු පියවරු තිදෙනා ලෙසද හඳුන්වනු ලැබූහ (The Three Great Cappadocians ). සාධාර්මික දේවවේදය (Orthodoxy of the Christian Doctrine) සම්බන්ධයෙන් ඔවුන් කළ සේවය අගනේය.

මූලික අධ්‍යාපනය හැදෑරුවේ කොන්ස්තන්තිනෝපල් නගරයේය. තාපය ජීවිතය සඳහා පියාගෙන් අවසර ඉල්ලුවත් ඊට ඉඩ නොලැබුණ බැවින් නිහඬ තපස් දිවියක් ගතකළ මෙතුමා පියාගේ මරණෙන් පසු භක්තිමත් මවගේ විරුද්ධත්වයක් නොවූයෙන් ක්‍රි.ව. 362 දී පූජකවරය ලබා ගත්හ. මෙතුමා 4 වන සියවස මැද භාගයේදි ඇතැන්ස්හි විශ්ව විද්‍යාලයට ඇතුළුවී දෙවි දහම හදාරන ලදී. කයිසාරියේ නසියන්සස් හී රදගුරුවරයකු ලෙස පසුකාලීනව කටයුතු කළහ. මෙතුමා අධ්‍යාපනය ලබා ගත්තේ තම වැඩිමහල් සොහොයුරු බැසිල් තුමාගෙනි. සැමවිට සැම අවස්ථාවලදීම ඔහුගේ ගුරුවරයා බැසිල් තුමාය. අධ්‍යාපනය හැදෑරීමෙන් පසු තාපාසාරාමයක ඉගැන්වීම ඔහුගේ මුල් රැකියාවයි. රැකියාවට වඩා තාපය ජීවිතයට ඇතුල්වූ නිස්සා හී ග්‍රෙගරි පොන්ටස්හී තාපසාරාමයට ඇතුල්විය.

ටිකකලකට පසු කයිසාරියේ මෙන්ට්‍රෝපොලිටන්හි තාපස නිකායක නායකයා ලෙස පත්විය. ක්‍රි.ව. 380 දී සෙබස්ටිහී ප්‍රධාන රදගුරු ධුරයට උසස් කරනු ලැබිය. නමුත් මෙතුමාගේ බලවත් ආශාව වූයේ නිසල පරිසරයක ජීවත් වීමයි. ක්‍රි.ව. 381 දී පැවැත්වූ කොන්ස්තන්තිනෝපල් සම්මන්ත්‍රණයේදී ප්‍රධාන චරිතයක් බවට පත්වූ නිස්සා හී ග්‍රෙගරි තුමා ඒරියන් වාදයට විරුද්ධව ප්‍රබල සටනක් මෙහෙය විය. කපදෝසියානු පියවරුන් අතරින් ප්‍රධානම තැනැත්තා වන මෙතුමා රදගුරු තුමකු ලෙසද දේව ධර්මාචාර්යවරයකු ලෙසද ප්‍රසිද්ධියක් ඉසුලූ සහා පියෙකි. ක්‍රි.ව. 334 දි මෙතුමාගේ මරණය සිදුවිය.

**අසේල දසනායක විසිනි**

# කොටහේන යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ ප්‍රාථමික අංශයෙන් ප්‍රසංගයක්





කොටහේන යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ ප්‍රාථමික අංශය මගින් පසුගියදා ''මම විශ්වාස කරමි'' තේමාව යටතේ ගැලවීමේ ඉතිහාසය තුළ විශ්වාසය ගලා ගිය ආකාරය ප්‍රථම වතාවට ප්‍රාසාංගික උත්සවයක් ලෙසින් රඟදැක්විනි. මෙදින අවස්ථාවන් සේයාරුවෙහි දිස්වේ.

**යසඟි සවින්දී** - යහපත් එඬේරා කන්‍යාරාමය - කොටහේන






මොරටුව කටුකුරුන්ද ශාන්ත මරියා දහම් පාසලේ ළමෝ 31 දෙනෙකු ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ.

දිව්‍ය පූජාව කටුකුරුන්ද මීසම් සේවක ගරු ක්‍රිශන්තස් ප්‍රනාන්දු නි.ම.නි. පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර, ගරු රෙජිනෝල්ඩ් ජයමහ නි.ම.නි. පියතුමාද සහභාගි විය. දිව්‍ය පූජාව අවසානයේ ගරු පියතුමන්ලා , ළමුන් පුහුණු කළ දහම් ගුරුවරුන් හා දිවබොදුන් ලැබූ දරු දැරියන් සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **අසික ප්‍රියදර්ශන**

---



හල්පෙ මීසමට අයත් පතැගි ගොඩැල්ල ශු. ආරෝග්‍යමාතා දෙව් මැඳුරේ දරු දැරියෝ 16 ක් පසු ගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද ලබා ගත්හ. දේව මෙහෙයෙන් පසුව ආරාධිත ගරු බර්නාඩ් නෙවිල් පියතුමා, මීසම් සේවක ගරු අමිල් ගෝමස් , මීසම් සහයක ගරු සුරංග ෆොන්සේකා යන පියතුමන්ලා දරුවන් පුහුණු කළ දහම් ගුරුවරුන් ළමුන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු

**සටහන - ලියෝනි පෙරේරා / සේයා- ඒච්.ඩී. කල්දේරා**

---



ආඬිඅම්බලම ශුද්ධවූ ජපමාල මාතා දහම් පාසලේ දරු දැරියෝ 24 ක් පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ.

මීසම් සේවක ගරු නිමල් පොන්වීර පියතුමා, ආඬිඅම්බලම ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ ප්‍රධාන මව්තුමිය ගරු හියුබර්ට් මාරි පැවිදි සොහොයුරිය ගරු ජසින්තා ප්‍රනාන්දු පැවිදි සොහොයුරිය, දහම් ගුරුවරියන් සමග දිව බොදුන් ලබාගත් දරු දැරියන් ළමා ප්‍රදීපය කැමරාවට මුහුණ දුන් අයුරු. **සේයා - ටී. සුනිල් ප්‍රනාන්දු**


ශුද්ධවූ බයිබලය ඇසුරෙනි
මෝසෙස්
චිත්‍ර කථා රචනය ආනන්ද කාලිදේරා
දෙබස් හා චිත්‍ර: ඇස්. ඒ. පී. සමරආරච්චි
28
මෝසෙස් සහ ආරොන් එකිනෙකා.. වැළඳ ගනිමින්...
ආරොන්.. මම මේ.. නුඹව සොයා .එන ගමනි.
මොනවා.. ..නුඹ.. කොහොමද මා එන බව දන්නෙ.
දෙවියන් වහන්සේ මා ඉදිරියේ පෙනී සිට මට සියල්ල විස්තර පැවසුවා..
මොනවා දෙවියන් වහන්සේ මා ඉදිරියෙන් පෙනී සිට නුඹ හමුවීමට සීනායි කන්ද දෙසට යන ලෙස පැවසුවා.....
.මෝසෙස් නුඹ.. කොහෙද මෙපමණ කලක් ගිහින්.. ...සිටියෙ...
එදා මා ඊජිප්තු සෙබළාව මරා දැමූ පසු පාරාවෝ රජු මාව මරා දමන නියෝග කළා.. මම රට හැරීම.. මිදියන් වලට පළා ගියා... එහි එඬේර නායකයෙකුගෙ බැටළුවන් බලාගනිමින් සිට... ඔහුගෙ දියණියක් මා විවාහ කරගත්තා... මා දිනක්.. බැටළු රැළ දක්කාගෙන සීනායි කන්ද දෙසට ගියා... එහිදී දෙවියන් වහන්සේ මා ඉදිරියේ පෙනී සිට මට සියල්ල විස්තර කීවා.. ඉන්පසු ඊජිප්තුවට ගොස් මාගේ සහෝදර ආරොන් හමුවී ඔහුගෙන් උදව් ලබාගන්නා ලෙස.. මට පැවසුවා....
මම මේ නුඹව සොයා එන ගමන්
එහෙනම් දෙවියන් වහන්සේ අපව නැවත මුණගැස්සුවා.. දෙවියන්වහන්සේ ඔබට... ...ස්තුති වේවා...
හොඳයි මෝසෙස් අප සැවොම දෙවියන්වහන්සේ නුඹ ඊජිප්තුවට යවන බවට ඇති සාක්ෂි මොනවද ?
උන්වහන්සේ මට හාස්කම් කිරීමට බලය දුන්නා.
මේ තියෙන්නෙ ..සාක්ෂි...





ළමා ප්‍රදීපය



# බයිබල්දැනුම් මිනුම් තරගයේ ත්‍යාග ප්‍රදානෝත්සවය

බයිබල් දැනුම මිනුම තරගයේ ත්‍යාග ප්‍රදානෝත්සවය පසුගියදා අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් හා විශ්‍රාමික රදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගොමිස් හිමිපාණන් හා වතිකාන තානාපති අති උතුම් ජෝශප් ස්පෙටරි රදගුරු හිමිපාණන්ගේ මූලිකත්වයෙන් පැවැත්විණි. බයිබල් දැනුම මිනුම තරගාවලියෙන් ජය ලැබූ දරු දැරියන්ට ත්‍යාග ප්‍රදානය කිරීමද මෙහිදී සිදුවිය.

**ඡායාරූප: අශේන් එස්. සේනාරත්න**










